www.wsws.org
ලෝක සමාජවාදී වෙබ් අඩවිය
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# ශ්‍රී ලංකාවේ ජනාධිපතිවරනය: නසසපය සහ ජාතික අවස්ථාවාදයේ අවෘත අන්තය

## Sri Lankan presidential election : the NSSP and the dead-end of national opportunism

**විලානි පීරිස් විසිනි**
**2005 නොවැම්බර් 10**

ශ්‍රී ලංකාවේ බොහෝ දේශපාලන පක්ෂ නොවැම්බර් 17 ජනාධිපතිවරනයේ දී ප්‍රධාන පක්ෂ දෙක (එක්සත් ජාතික පක්ෂය (එජාප) සහ ශ්‍රී ලංකා නිදහස් පක්ෂය (ශ්‍රීලනිප) ) පිටුපස කෙලින්ම පෙල ගැසී සිටියි.

නව සම සමාජ පක්ෂය (නසසප) වෙනුවෙන් සිටින පෙරකලාසිකරුවකු වන නව වාමාංශික පෙරමුන (නවාපෙ) මින් බැහැර වූ අතලොස්සකින් එකකි. ඔවුන්ගේ ජාතික සංවිධායකවරයා වන චමල් ජයනෙත්ති නවාපෙ ජනාධිපති අපේක්ෂකයා ලෙස ඉදිරිපත්ව සිටින අතර මේ පක්ෂය ''වාමාංශික'' විකල්පයක් ලෙස තමන්ව ම පෙරට දමා ගෙන සිටියි. පසු ගිය මස ප්‍රසිද්ධියට පත් කරන ලද ඔවුන්ගේ ප්‍රතිපත්ති ප්‍රකාශනය තුල ''ලොව පුරා වාමාංශය නැගිටිමින් සිටී''යයි ප්‍රකාශයට පත් කර තිබෙන අතර, වෙනිසියුලාවේ, ආජන්ටිනාවේ සහ බ්‍රසීලයේ ජයග්‍රහන''එජාප සහ ශ්‍රීලනිප විකල්ප අතරට ''තුන්වන ගැලවුම් මගක්'' පෙන්නුම් කරන්නේ යයි ආවඩයි.

සත්‍ය වසයෙන් ම නවාපෙ හි ''තුන්වන මාවත'' කිසිදු අයුරක විකල්පයක් බවට පත් නො වේ. මින් බැහැරව ''ගෝලීය ජනතා ව්‍යාපාරය'' ලබාගත් ජයග්‍රහන සහ වෙනිසියුලාවේ ජනාධිපති හියුගෝ ශාවේස් වැනි විවෘත ධනේශ්වර ආන්ඩුවලට කෙරෙන මොවුන්ගේ වක්කඩ කැඩුවා වැනි ප්‍රසංශා තමන්ගේ අමු ම අමු අවස්ථාවාදී සහ ජාතිකවාදී ප්‍රතිපත්තිවලට තුනී ''ජාත්‍යන්තරවාදී'' ලෝගුවක් සම්පාදනය කිරීමේ ප්‍රයත්නයකි.

''ගෝලීය ජනතා ව්‍යාපාරයේ'' අනෙකුත් කොටස් සේ ම නවාපෙ ද බලාපොරොත්තුව සිටින්නේ සමාජවාදය නොව ජාතික ආර්ථික විධි විධාන යලි පැනවීම මත පදනම්වන ප්‍රතිසංස්කෘත ධනවාදයකි. ''ගෝලීය ධනවාදයේ ඊනියා විවෘත ආර්ථිකය පිටු දැකීමට අපට සිදු වේ'' යයි ප්‍රකාශ කරන ප්‍රතිපත්ති ප්‍රකාශනය ''අපේ වෙලඳ පොල සහ අපේ දේශීය නිෂ්පාදන බලවේග ආරක්ෂා කිරීමට'' වෙලඳාම සහ මුදල් හා ප්‍රාග්ධන සංචරනය මත ජාතික පාලනයන් යලි පැනවීම ඉල්ලා සිටියි.

ප්‍රාග්ධනය සහ නිෂ්පාදනය ඉහල ම ලාභ සහ මුදල් සොයමින් නිරන්තරයේ ම තැනින් තැනට ගමන් කරන කොන්දේසි යටතේ තමන් මෙම ආර්ථික ප්‍රාතිහාර්යය ඉෂ්ඨ කර ගැනීමට සැලසුම් කරන්නේ කෙසේ ද කියා නවාපෙ කිසිදු පැහැදිලි කිරීමක් නොකරයි. ප්‍රකාශනයෙන් මුලුමනින් ම ඉදිරිපත් කරන්නේ ''තුන්වන ගැලවුම් මාවතක් ඉදිරිපත් කල හැකි ය... ජනයා නිෂ්පාදනය සහ පරිභෝජනය අවබෝධ කර ගනිමින් එය පෘථුලවූත්, ජාතිකවූත්, පිටස්තර නොවූ සංවර්ධනයකට යොමු කිරීම'' ලෙස ප්‍රකාශ කල ''ගෝලීයකරන විරෝධී'' ව්‍යාපාරයේ න්‍යායවාදියෙකු වන පිලිපීන ශාස්ත්‍රඥ වෝල්ඩන් බෙලෝගේ ප්‍රකාශයන්ගෙනි.

පිටස්තර වුවද නොවූවද, කෙතරම් විශාල හෝ කුඩා හෝ වුවද ශ්‍රී ලංකාවේ, පිලිපීනයේ හෝ අන් කවර රටක වුව ද රාමුව ඇතුලත ආර්ථික සංවර්ධනයේ ජාතික මාවතක් නැත. පරිගනක සහ සංනිවේදන තාක්ෂනයේ විප්ලවවාදී වර්ධනයන් මත පදනම්ව පසු ගිය දශක දෙක පුරාවට ඇති වූ නිෂ්පාදනයේ ගෝලීය කරනය මුලුමනින් ම ප්‍රගතිශීලී වර්ධනයකි. කෙසේ වෙතත්, ධනවාදය තුල දී මෙයින් සිදු වූයේ ගෝලීය ආර්ථිකය සහ යල් පැන ගිය ජාතික රාජ්‍ය පද්ධතිය අතර අති මූලික ප්‍රතිවිරෝධතා උත්සන්න වීම සේ ම දුප්පතුන් සහ පොහොසතුන් අතර සමාජ අගාධය උත්සන්න වීම පමනකි. විසඳුම තිබෙන්නේ නිෂ්පාදන බලවේග ජාතික රාජ්‍ය තුල කෘතිමව සිර කිරීමේ ප්‍රතිගාමී ප්‍රයත්නය තුල නොව ලෝක සැලසුම්ගත සමාජවාදී ආර්ථිකයකින් ගෝලීය ධනවාදය විස්ථාපනය කිරීම තුල ය.

බෙලෝ සහ නවාපෙ එවන් ක්‍රියා මාර්ගයකට සටන් කිරීම අවධාරනාත්මකව බැහැර කරයි. අර්ථභාරීව, 2002 දී නිව් ලෙෆ්ට් රිවීව් සඟරාව සමග කල සාකච්ඡාවකදී බෙලෝ මෙසේ ප්‍රකාශ කලේ ය: ''මම තව දුරටත් ලෙනින්වාදියකු ලෙස හඳුන්වා නොගන්නෙමි. මක් නිසාද යත්, මට සිතෙන්නේ කොමියුනිස්ට් සමාජයන්ට බැට දුන් අර්බුදය ලෙනින්වාදී පෙරටු බලඇනි සංවිධානවල පවතින ප්‍රභූ ස්වභාවය සමග බැඳී තිබෙන

බව ය.'' මොහු පෙර සෝවියට් සංගමයේ වූ ස්ටැලින්වාදී පාලනය ''කොමියුනිස්ට් සමාජයකි''යි වරදවා සලකාගෙන එය බිඳ වැටීම පිලිබඳව මාක්ස්වාදයේ හෝ ලෙනින්වාදයේ අසාර්ථකත්වයට දොස් පවරන බොහෝ දෙනා ගෙන් එක් කෙනකු පමනි.

සත්‍ය වසයෙන්ම, සෝවියට් සංගමය එහි දැඩි ලෙස වසා තැබුනු ආර්ථිකය මතට එල්ල වුන ගෝලීය නිෂ්පාදනයේ බලපෑම යටතේ බිඳ වැටීම, ආර්ථික කාලමානය ආපසු හැරවිය නොහැකි මක් නිසා ද යන්නට ඇති එක් පැහැදිලි ම උදාහරනයකි.

නවාපෙ ප්‍රකාශනයේ විශේෂයෙන් ම එලිදරව් කරන්නා වූ ඡේදයක, ලංකා සම සමාජ පක්ෂය (ලසසප) හා ශ්‍රී ලංකාවේ කොමියුනිස්ට් පක්ෂය සමග ධනේශ්වර ශ්‍රීලනිපය බලයේ සිටිය 1970 සිට 1976 දක්වා වූ කාලය පිලිබඳව ස්මරනය කරයි. එකල නසසප නායකයෝ, පෙර දී ට්‍රොට්ස්කිවාදී පක්ෂයක් ව සිට 1964 දී සිරිමා බන්ඩාරනායක ගේ පලමු සභාගයට එක් වෙමින් සමාජවාදී ජාත්‍යන්තරවාදයේ පිලිවෙත්වලින් නිශ්චිතව ම බිඳී වෙන් වුන ලසසපයේ සාමාජිකයෝ වූහ.

1970 ගනන්වල තිබූ බන්ඩාරනායක දෙවන සභාගය කම්කරු පන්තියට අඩුවක් නැති ව්‍යසනයක් විය. යලිත් ආපසු හැරී බලන විට නසසපය අවශ්‍ය වූ පාඩම ඉගෙන ගත්තේ යැයි කියා පායි. ''ඍජු, ජාතික, හුදකලා නොවූ වර්ධනය'' පිලිබඳ බෙලෝගේ සිහිනය පිලිබඳව සටහන් කරමින් ප්‍රකාශනයේ මෙසේ සඳහන් වෙයිත

මෙය අපව 70/75 දී සිදු වූ සංවර්ධනය පිලිබඳව සාකච්ඡාවකට යලි ගෙන යයි. වාමාංශික නායකයන් වැරදි දෙකක් කල බව එවිට අපට පෙනී යයි. එක් අතකින්, ස්වෝත්තමවාදී ධනපතීන් යටතේ තමන්ට ප්‍රජාතන්ත්‍රීය කාර්යයන් කල හැකි වේ යයි ඔවුහු සිතූහ. අනෙක් අතට මේ පසුගාමී වටපිටාව තුල හුදෙකලා සමාජවාදී ව්‍යාපෘති ක්‍රියාවට නැංවීමට ඔවුහු වෑයම් කලහ. මේ හේතුවෙන්, දූෂිත හා නිලධාරීවාදී කන්ඩායම් ඉසුරුමත් වෙද්දී ජනතාවට මැදිහත් වීමට තිබූ ප්‍රජාතන්ත්‍රීය බලය අහිමි විය. ස්වෝත්තමවාදී වෙනස්කම් කිරීම සිය අශෝභන හිස එසවී ය. ඒ හා සමග ම දේශීය කර්මාන්තකරුවන් සහ නිෂ්පාදකයන්ව බියවැද්දීම සහ අවමානයට ලක් කිරීම සිදු විය. අවසන, ධනපතියන් විසින් වාමාංශික නායකයින් පලවාහැර ජේආර් (දක්ෂිනාංශික එක්සත් ජාතික පක්ෂයේ (එජාප) ජේආර් ජයවර්ධන) බලයට ඒමට පෙරාතුව ම ආන්ඩුව විවෘත ආර්ථිකය දෙසට තල්ලු කර දමන ලදී.''

## සභාගය තුල ''වාමාංශය''

වර්තමාන නසසප නායකයන් ලසසපයේ කොටසක් ලෙස එහි පිලිවෙත්වලට කෙලින් ම වගකිව යුතු ය යන කාරනාව වහංගු කිරීමට සැලසුම් කල වාසියට යොදා ගත් මුසාවන් හා අර්ධ සත්‍යයන්ගෙන් මෙම ඡේදය අතුරු සිදුරු වී තිබේ. නසසපය පිහිටවූ අය ලසසපයෙන් බිඳී ගියේ එය ආන්ඩුවෙන් පලවා හැරීමෙන් පසු පමන ය. එසේ ම එම පලවාහැරීම කලේ ධනපතියන් නොව ඇගේ පාලනයට ''සමාජවාදී'' වෙස්වලාවක් සම්පාදනය කිරීමේ ලා එම පක්ෂයේ කාර්යය අවසන්ව ඇතැයි තීරනය කල ශ්‍රීලනිප නායිකා බන්ඩාරනායක විසිනි.

සියල්ලටමත් වඩා, ප්‍රධාන අමාත්‍ය තනතුරු දරූ ලසසප නායකයන් ශ්‍රීලනිපය සමග සභාගයකින් ප්‍රජාතන්ත්‍රීය හැකියාවන් පිලිබඳ සරලව මුලාවූවා ද නො වේ. මෙයට පරිබාහිරව ඔවුහු ස්වෝත්තමවාදී පිලිවෙත් ක්‍රියාවට නැංවීම පිලිබඳව ද සියල්ලටමත් වඩා බුද්ධාගම රාජ්‍ය ආගම කල හා සිංහල රාජ්‍ය භාෂාව ලෙස පැනවූ 1972 වර්ගවාදී ව්‍යවස්ථාවට ද ඍජු වගකිව යුත්තෝ ය. ලසසප නායක කොල්වින් ආර් ද සිල්වා විසින් කෙටුම්පත් කැරුනු ව්‍යවස්ථාව අධ්‍යාපනය, ව්‍යාපාර, රැකියා සහ ඉඩම් පිලිබඳව දිවයිනේ දෙමල සුලුතරයට එරෙහිව වෙනස්කම් කිරීමේ විධි විධාන මාලාවක තියුනුම වූ ප්‍රකාශනය යි.

මෙම පියවරයන්ට පසුබිමින් වූයේ ඉහල යන සමාජ ආතතිය හා බැඳී පැමිනුන තෙල් මිලේ තියුනු ඉහල යාම්, උද්ධමනය සහ ගෝලීය අවපාතයට ලිස්සා වැටීම ය. 1971 දී සභාග ආන්ඩුව ජනතා විමුක්ති පෙරමුන නායකත්වය දුන් අතෘප්තියට පත් සිංහල ගැමි තරුනයන්ගේ නැගිටීමක්, 15,000කට වැඩි තරුනයන් පිරිසක් ඝාතනය කරමින් ද තවත් 20,000ක් හිතුමතේ රඳවා ගනිමින් ද කෘර ලෙස මර්දනය කර දැමී ය. ආන්ඩුව විෂඝෝර වර්ගවාදී පිලිවෙත් දෙසට හැරීගැනීම එල්ල වූයේ දකුනු සිංහල ප්‍රදේශවල සිය සහයෝගිතා පදනමට මුක්කු ගසා ගැනීමට ය.

''හුදෙකලා සමාජවාදී ව්‍යාපෘති'' මෙම හැඩගැස්ම සමග බැඳී තිබුනි. තේ වතු සහ අනෙකුත් ව්‍යාපාර ජනසතු කිරීම සමාජවාදී පියවරක් නොව දිවයිනේ ධනපති ආර්ථික ස්ථාවර කර ගැනීමේ එක් සැලසුමක් විය. තේ වතු සම්බන්ධයෙන් ගත් කල මෙය තදින්ම අයුක්ති සහගත වී ය. කම්කරු බලකායේ බහුතරය දෙමල කථා කරන්නන් වුවද නව කලමනාකරනය මුලුමනින් ම සිංහල වී ය. දෙමල කම්කරුවන්ට ඉන්දියාවට යාමට බල කිරීමට හිතාමතා ම සැලසුම් කල පිලිවෙතකට අනුව වතු ක්ෂේත්‍රයේ ගැඹුරු වූ පසුබෑම සහ විරැකියාව මධ්‍යයේ මිනිසුන් බොහෝ ගනනක් කුසගින්නේ මිය ගියහ.

සිය ප්‍රකාශනයෙන් නසසපය කියාපාන බොහෝ පිලිවෙත් ලසසප නායකයෝ භාවිතාවට දැමූහ. ප්‍රකට ලසසප නායකයෙකු වූ මුදල් අමාත්‍ය එන් එම් පෙරේරා ශ්‍රී ලංකා ආර්ථිකය ගෝලීය අවපාතයෙන් රැක ගැනීම සඳහා ප්‍රාග්ධන, ආනයන, මිල සහ මූල්‍ය පාලන සමුදායක් පැනවී ය. මිල ගනන් රොකට් වේගයෙන්

ඉහල යද්දී පවා ඔහු ආර්ථිකය නංවා ලනු පිනිස තමන්ගේ පටි තද කර ගන්නා ලෙස කම්කරුවන්ට කීවේ ය. ළදරුවන්ගේ කිරිපිටි වැනි මූලික භාන්ඩ ලබා ගැනීමට නොතිබුනු අතර සහල්, මයිසූර් පරිප්පු, සීනි සහ පිටි වැනි අනෙක් අත්‍යාවශ්‍ය භාන්ඩ සලාක ක්‍රමයට යටත් කැරුනි. ජනයාට භාන්ඩ ලබා ගැනීමට දිග පෝලිම්වලට වී සිටීමට සිදු විය.

ශ්‍රී ලංකාවේ ආර්ථික අර්බුදය ගෝලීය පදනමක නිෂ්පාදනය යලි සංවිධානය කිරීමට ද විශේෂයෙන් ම ආසියාවේ ලාභ ශ්‍රමයේ දූවැන්ත වූ නව සංචිත ගසා කෑමට ද ධනේශ්වරය තල්ලු කර දැමීම ජාත්‍යන්තර අර්බුදයේ කොටසකි. 1975 දී සිය ''වාම'' මිතුරන් කානුවට විසිකරමින්, මහ බලවතුන් ඉල්ලා සිටි විවෘත වෙලඳ පොල පිලිවෙත්වල ලොව එක් මුල් ආරම්භකයෙක් වූයේ බන්ඩාරනායක ආන්ඩුව ය. එහෙත් ආන්ඩුවට නැගී ආ ජනතා වෛරයේ රැල්ල මොට කිරීමට නොහැකි විය. පෙරේරාගේ පාලන රෙගුලාසි යටතේ සිය නිෂ්පාදන අලෙවි කල නොහැකි වූ ගම්බද ප්‍රදේශවල ගොවියෝ 1977 මැතිවරනයේ දී කොන්සර්වේටිව් එජාපය දෙසට තීරනාත්මකව හැරුනි. ආසන 168ක පාර්ලිමේන්තුවේ ශ්‍රීලනිපය හුදු ආසන 8කට බැස්ස අතර ලසසපය හා කොපය සිය ආසන සියල්ල අහිමි කර ගත්හ.

නව එජාප අගමැති ජේආර් ජයවර්ධන ඒකාධිපති විධායක ජනාධිපති ධුරයේ ස්ථාපිත කිරීමට සහ ඊලඟ 17 වසර තිස්සේ සිය පක්ෂය බලයේ පැලපදියම් කර තැබීමට ව්‍යවස්ථාව යලි ලිවීමට සිය දූවැන්ත බහුතරය භාවිත කලේ ය. ඔහු ගේ ආන්ඩුව ආර්ථික ප්‍රතිව්‍යුහකරන ක්‍රියා මාර්ග උත්සන්න කල අතර නැග ආ විරුද්ධත්වයට ප්‍රතිචාර ලෙස, කම්කරුවන්ව බෙදීමට සිංහල ස්වෝත්තමවාදය ඇවිස්සී ය. එක්සත් ජාතික පක්ෂය 1983 යුද්ධය ඇති කලේ වුව ද පුලිඟුව දැල්වූයේ නසසප නායකත්වයන් ද වගකිව යුතු වන ශ්‍රීලනිප-ලසසප වර්ගවාදී පිලිවෙත් ය.

## නසසපයෙන් සමාජවාදය ඉවතට

දශක දෙකකටත් පසුව ජාතික ආර්ථික පාලනයන්ගේ පිලිවෙත් කරා යලි එලඹිය හැකි යයි කියා සිටීම උන්මත්තක ය. ඔවුන්ගේ වාර්තාව පිලිබඳව විෂයබද්ධ තක්සේරුවක් කිරීම අසමත්වූ නසසපය ලබා ගත් එකම පාඩම ලෙස පෙනී යන්නේ, දේශීය ව්‍යාපාරිකයන් හා ධන හිමියන් අමනාප වේ ය යන බිය නිසා ''සමාජවාදී'' පම්පෝරි පෙරට දැමීමේ දී වඩාත් පරිස්සම් සහගත වියයුතු ය යන්න ය.

ඔක්තෝබර් 30 රාවය පුවත්පතට නවාපෙ අපේක්ෂක ජයනෙත්ති දුන් සම්මුඛ සාකච්ඡාවකින් නසසපය සමාජවාදය මුලුමනින් ම ප්‍රතික්ෂේප කිරීම පැහැදිලිව පෙනුනි. සමාජවාදී සමානතා පක්ෂයට (සසප) වක්‍රව පහරක් එල්ල කරමින් ඔහු මෙසේ ප්‍රකාශ කලේ යː

''තමන්ව ම වාමාංශිකයන් යයි හඳුන්වා ගන්නා සමහර අය ජනාධිපතිවරනයේ දී සමාජවාදය ඉදිරිපත් කරයි. එක රටක සමාජවාදයට යාම කල නොහැකි ය. අපි එම සමාජවාදය යන වචනය ම පැහැදිලිව ප්‍රතික්ෂේප කරමු. දැන් අපට අවශ්‍යව තිබෙන්නේ සමාජවාදය නො වේ. ප්‍රශ්නය වනුයේ රටේ තිබෙන අර්බුදයට ඇති වාම විසඳුම කුමක් ද යන්න ය.''

මෙම සඳහන් කිරීම් සසප මැතිවරන ප්‍රකාශනය දුෂ්ඨ ලෙස විකෘති කිරීමකි. ශ්‍රී ලංකාවේ වේවා අන් තැනක වේවා එක් රටක සමාජවාදය ගොඩ නැගීම කල නොහැකි බව එම ලේඛනය පැහැදිලිව කියා සිටී. සසපයේ සහ හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ එහි සහෝදර පක්ෂවල ක්‍රියා මාර්ගයේ හරි මැද තිබෙන්නේ ලෝක ආර්ථිකය සමාජවාදී මාවතක් ඔස්සේ යලි හැඩ ගැස්සවීමේ අවශ්‍යතාව මත පදනම්වූ අධිරාජ්‍යවාදයට එරෙහි ගෝලීය ප්‍රහාරයකට කම්කරු පන්තිය ජාත්‍යන්තරව පෙල ගැස්සවීමේ අරගලය ය. වෙනත් වචනවලින් නම්, ගෝලීය ධනවාදයට අව්‍යාජ සමාජවාදී පිලිතුර ගෝලීය සමාජවාදය සඳහා අරගලය ය.

කෙසේ වෙතත්, නසසපය මුලුමනින් ම වෙනස් නිගමනවලට එලඹෙයි. ඔවුහු සමාජවාදය මුලුමනින් ම පිලිකෙව් කරනු උදෙසා ද දේශීයව හා විදේශීය ව ජාතික ධනේශ්වරයේ නියෝජිතයන් සමග අවස්ථාවාදී හවුලක් සොයා ගැනීම උදෙසා ද කපටි උපක්‍රමයක් ලෙසට එක් රටක සමාජවාදය ගොඩ නැගීමේ නොහැකියාව උපුටා දක්වති. පසු ගිය දශක තුන මුලුල්ලේ නසසප ඉතිහාසයේ අවස්ථාවාදී දඟර හා හැරීම් සියල්ල දැක්වීමට පොත් පිංචක් අවශ්‍ය වේ. පසු ගිය දස වසර ගත හොත්, 1994 දී නසසපය ජනාධිපතිනි චන්ද්‍රිකා කුමාරතුංගගේ පොදු පෙරමුන (පොපෙ) ට සහාය දක්වා, 1990 ගනන් අග දී ජවිපෙ සිංහල ස්වෝත්තමවාදීන් සමග ගනුදෙනුවකට ගොස් 2004 මහ මැතිවරනයේ දී ''අඩු නපුර'' ලෙස දක්ෂිනාංශික එජාපය ඔසවා තැබී ය.

''ස්වෝත්තමවාදයට'' විරෝධය දක්වන අතරේ ම නසසපය ශ්‍රී ලංකාවේ නිල දේශපාලනයේ වර්ගවාදී රාමුව පිලිගනී. මෙහිදී පෙන්වා දිය හැකි කරුනක් වන්නේ ප්‍රධාන අධිරාජ්‍යවාදී බලවතුන් සහ දේශීය සංගත නායකයන් විසින් පෙරට දමනු ලැබූ ''සාම ක්‍රියාවලිය'' ට ඔවුන් දක්වන සහයෝගය යි. යුද්ධයට ලබාදෙන සමාජවාදී විසඳුමක් වටා දෙමල හා සිංහල කම්කරුවන් එක්සත් කිරීමට සටන් කරනවා වෙනුවට, වර්ගවාදී බෙදීම් තහවුරු කරන්නා වූ ද කම්කරු පන්තිය සූරා කෑම ගැඹුරු කරවීමට පාදක වන්නා වූ ද, කොලඹ ආන්ඩුව සහ දෙමල ඊලම් විමුක්ති කොටි (එල්ටීටීඊ) අතර බලය බෙදා ගැනීමේ ගනුදෙනුවකට නසසපය සහාය දෙයි.

ජූනි මස ඉරිදා ලක්බිම හි ඔහුගේ කොලමින් ඉදිරිපත් කල නව ''න්‍යායාත්මක'' සොයාගැනීමක් තුලින් නසසප නායක වික්‍රමබාහු කරුනාරත්න පක්ෂයේ දේශපාලන මාවතේ තව දුරටත් සිදුවන පරිහානිය සංඥා කලේ ය. වෙනිසියුලාවේ හිටපු රැඩිකල් ජෙනරාල්වරුන්ට හුරේ දැමීම සේ ම නසසපය දැන් ප්‍රධාන අදිරාජ්‍යවාදී බලවතුන්මත් ප්‍රගතිශීලී වෙනස්කම් කිරීමේ බලවේගයක් යයි ද ප්‍රකාශ කරයි. ''ලෝක ධනවාදය අද ලිබරල් ප්‍රජාතන්ත්‍රවාදී ව්‍යාපාරයන් වර්ධනය කිරීම වෙනුවෙන් මුදල් වැය කරයි. අතීතයේ දී ප්‍රචාරය සහ රහස් මර්දන ක්‍රියාමාර්ග වෙනුවෙන් ඔවුන් වැය කල මුදල් දැන් අප වැනි රටවල ලිබරල් ව්‍යාපාර වර්ධනය කිරීමට වැය කරතැයි කිවහොත් නිවැරදි ය''යි ඔහු ලිවී ය.

මෙය 1960 ගනන් හා 1970 ගනන්වල දී අධිරාජ්‍ය විරෝධී රැඩිකල් වාචාලකම්වලින් කට මුවහත් කර ගත් මිනිසකුගෙන් එන අසාමාන්‍යවූ ප්‍රකාශනයකි. මෙය ඊට ද වඩා අසාමාන්‍යවනුයේ, ඇමරිකානු අධිරාජ්‍යවාදය ඇෆ්ඝනිස්ථානය සහ ඉරාකය ආක්‍රමනය කිරීමේ සහ යටත් කර ගැනීමේ සන්දර්භය තුල ය. මෙම නව-යටත් විජිතවාදී ව්‍යායාමයන් සමග කරුනාරත්න සිය ප්‍රකාශය නිවැරදි කිරීමට වෑයමක් දරන්නේ නැතුවා මෙන් ම කාබුලයේ සහ බැග්ඩෑඩයේ රූකඩ පාලන, ''ලිබරල් ව්‍යාපාරයන්'' වෙත වොෂිංටනය දක්වන සහයෝගයට පවතින සාක්ෂි ලෙස දක්වන බවක් ද නොපවසයි.

ඉරාකය තුල ඇමරිකානු අපරාධ නොතකා හරිමින් කරුනාරත්න, ජනාධිපති කුමාරතුංගගේ ද එජාප නායක හා ජනාධිපති අපේක්ෂක රනිල් වික්‍රමසිංහගේ ද ශ්‍රී ලංකාව තුල සාම ක්‍රියාදාමය යලි ඇරඹීමේ ප්‍රයත්නයන් ''ලිබරල් ව්‍යාපාර'' සඳහා ඇමරිකාව සහාය දැක්වීමට සාක්ෂි ලෙස ගෙන හැර දක්වයි. මෙම ධනේශ්වර දේශපාලනඥයන් සහ පක්ෂ (කම්කරු ජනයාගේ ප්‍රජාතන්ත්‍රීය අයිතීන් සහ ඔවුන්ගේ සමාජ තත්වයට ප්‍රහාර එල්ල කිරීමේ දීර්ඝ වාර්තාවක් ඇති) වලට නසසපයේ ඇති සහයෝගය කුනුහරුපයකට අඩු වූවක් නො වේ. එය රැඩිකල් දේශපාලනයේ අවෘත අන්තය නියෝජනය කරයි.

අධිරාජ්‍යවාදී බලවතුන්, විශේෂයෙන් ම, බුෂ් පරිපාලනය ලොව වටා ලිබරල් ව්‍යාපාර දිරිමත් කරන්නේ ද සහයෝගය දෙන්නේ ද යනුවෙන් කියා පෑම දේශපාලනිකව සාපරාධී ක්‍රියාවකි. ශ්‍රී ලංකාව තුල වොෂිංටනයේ මූලෝපාය ද මැද පෙරදිග සහ මධ්‍යම ආසියාවේ ඔවුන්ගේ ඉදිරි දර්ශනයට වඩා වෙනස් නො වේ. නොවිසඳිය හැකි ආර්ථික අර්බුදයකින් තෙරපෙන ඇමරිකානු අධිරාජ්‍යවාදය සිය යුරෝපීය සහ ආසියානු විරුද්ධවාදීන් මත ආධිපත්‍යය පැටවීමට මාන බලයි. ශ්‍රී ලංකාවේ යුද්ධය ඉන්දියානු උපමහාද්වීපයේ ඔවුන්ගේ ආර්ථික හා මූලෝපායික අභිලාෂයන්ට බාධාවකි. ශ්‍රී ලංකාවේ සාම ව්‍යාපාරය සඳහා වන වර්තමාන වොෂිංටන් සහයෝගය සරලව ම උපක්‍රමයක් වන අතර සාම කථා ඔවුන්ගේ උවමනාවන් ඉටු කිරීමට අසමත් වුව හොත් මෙය ඉක්මනින් ම වෙනස් විය හැක.

නසසප දේශපාලන දඟර ගැසීම් දිගින් දිගට ම ධනපති දේශපානයට යටත් වීම නියෝජනය කරයි. නසසප පෙනී සිටින සියල්ලට ම මුලුමනින් ම ප්‍රති විරුද්ධව සසප තරයේ කියා සිටින්නේ කම්කරු පන්තියට තම ප්‍රජාතන්ත්‍ර අයිතීන් සහ සමාජ කොන්දේසි රැක ගැනීම ආරම්භ කල හැකි වනුයේ සියලුම ධනේශ්වර පක්ෂවලින් ද ඒවායේ එල්ලී සිටින රැඩිකලුන්ගෙන් ද තීරනාත්මක දේශපාලනික වෙන්වීමකින් පමනක් බව ය. සසප සමාජවාදී ජාත්‍යන්තරවාදී ක්‍රියාමාර්ගය ඉටු කර ගත නොහැකි මනෝරාජික සංකල්පයක් නොව ගෝලීය ප්‍රාග්ධනයේ මංකොල්ලකාරී ක්‍රියාවන්ට සහ අධිරාජ්‍යවාදයේ පැන නැගීමට හා යුද්ධයට ඇති එක ම යථාර්ථවාදී පිලිතුර යි.

© www.wsws.org